## පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරය.

**අභියාචනා අංක:- AAT/113/2020 (NPC)**

පී.එම්.මිහිරානි

**අභියාචක**

**එදිරිව,**

ජාතික පොලිස් කොමිෂන් සභාව

**වගඋත්තරකරු**

දිනය : 2025.11.11

**ඉදිරියේ දී** **විනිසුරු කේ.ටී.චිත්‍රසිරි (සභාපති)**
**ජේ.ජේ.රත්නසිරි (සාමාජික)**
**එස්.නන්දසේකරන් (සාමාජික)**

පෙනී සිටීම :- අභියාචක සිටී.
අභියාචක වෙනුවෙන් විශ්‍රාමික රජයේ සේවක තිස්ස ගුණතිලක මහතා.
වගඋත්තරකාර ජාතික පොලිස් කොමිෂන් සභාව වෙනුවෙන් නියෝජ්‍ය අධ්‍යක්ෂ ආර්.එම්.එස්.පී.රත්නායක මහතා.

**-<u>නියෝගය</u>-**

දෙපාර්ශවය විසින් ඉදිරිපත් කර ඇති කරුණු වලට සවන් දෙන ලදී. අභියාචක වන පලවින්නගේ මහේෂි මිහිරාණි යන අය විසින් ඉදිරිපත් කර ඇති අභියාචනය මඟින් ඉල්ලා ඇත්තේ, මේ වන විට ඇය සේවයෙන් පහ කර ඇති හෙයින්, එම නියෝගය ඉවත් කර නැවත සේවයේ පිහිටුවීමට නියෝග කරන ලෙසයි. 2019.10.07 දිනැතිව, අභියාචකට එරෙහිව නිකුත් කර ඇති විනය නියෝගය කෙරෙහි විනිශ්චය අධිකාරයේ අවධානය යොමු කරන ලදී. එහි සඳහන් වන්නේ අභියාචකට එරෙහිව ඉදිරිපත් කර තිබූ චෝදනා පත්‍රය 2018.01.03 දින නිකුත් කර තිබූ නමුත්, ඇය විසින් එය භාර ගෙන ඇත්තේ, 2018.01.25 දිනදී බවත් එම කරුණ හේතුවෙන් චෝදනාවන්ට පිළිතුරු සැපයීමට නොහැකි වූ බවත්ය. ඒ අතරතුරදී චෝදනා පත්‍රයට පිළිතුරුනො සැපයීම යන කරුණ විනය විරෝධී ක්‍රියාවක් ලෙස සළකා ඇයව සේවයෙන් පහ

කරන ලද බවට ඇය විසින් සඳහන් කර ඇත. අභියාචක චෝදනාවන්ට පිළිතුරු සැපයීමට කටයුතු කර නොමැතිය යන කරුණ විනය විරෝධී ක්‍රියාවක් ලෙස සළකා ඇයව සේවයෙන් පහ කර ඇත. විධිමත් විනය පරීක්ෂණයක් නොපවත්වමින් කිසියම් නිළධාරියකු සේවයෙන් පහ කිරීමේ විනය නියෝගයක් නිකුත් කළහොත් එය වලංගු වන්නේ නැත.

ඒ අනුව බැලූ බැල්මට පෙනී යන්නේ, සේවයෙන් පහ කිරීමේ නියෝගය නිකුත් කිරීමට ප්‍රථමයෙන්, කිසිදු විනය පරීක්ෂණයක් පවත්වා නොමැති බවයි. එවැනි තත්ත්වයක් යටතේ, අභියාචක සේවයෙන් පහ කරමින් නිකුත් කර ඇති නියෝගය වලංගු නියෝගයක් වන්නේ නැත. එම කරුණු සළකා බලා ඉහත කී 2019.10.07 දිනැති විනය නියෝගය ඉවත් කිරීමට තීරණය කරමු.

කෙසේ වෙතත් මේ අවස්ථාවේදී පොලිස් කොමිෂන් සභාව වෙනුවෙන් කරුණු දක්වමින් පවසා සිටින්නේ, ඉහත කී 2018.01.03 දිනැති චෝදනා පත්‍රයට වැඩිමනක් වශයෙන්, එම චෝදනා පත්‍රය සංශෝධනය කරමින් 2018.01.18 දිනැතිව සංශෝධිත චෝදනා පත්‍රයක්ද ඉදිරිපත් කර ඇති බවයි. එම චෝදනාවට නිවැරදිකරු බවට ප්‍රකාශ කරමින් ඒ සම්බන්ධයෙන් විනය පරීක්ෂණයක් පවත්වන ලෙස අභියාචක විසින් ඉල්ලා ඇති බව, පොලිස් කොමිෂන් සභාව වෙනුවෙන් විවෘත අධිකරණයේ පවසා සිටී. ඉහත කී තත්ත්වය අභියාචනා පෙත්සම සමඟ පැ.06 වශයෙන් ඉදිරිපත් කර ඇති, 2018.02.06 දිනැති ලිපියෙන් තවදුරටත් තහවුරු වේ. ඒ අනුව පැහැදිළිව පෙනී යන්නේ අභියාචකට එරෙහිව ඉදිරිපත් කර ඇති චෝදනාව සම්බන්ධයෙන් විධිමත් විනය පරීක්ෂණයක් පවත්වා නොමැති බවයි. මේ අවස්ථාවේදී එකී සංශෝධිත චෝදනා පත්‍රයේ ඇතුළත් චෝදනාවන්ටද විනිශ්චය අධිකාරයේ අවධානය යොමු කරන ලදී. ඒ අනුව එම චෝදනා බරපතල අපරාධ ගණයට වැටෙන චෝදනා බවට පෙනී යයි.

ඉහත කී කරුණු සළකා බලමින් අභියාචක නැවත සේවයට පත් කිරීමට නිකුත් කරනු ලබන ලිපිය හා සමඟම, විනය පරීක්ෂණයක්ද පැවැත්වීමට තීරණය කර ඇති හේතුවෙන්, ඇයගේ සේවය අත්හිටුවමින් අභියාචක වෙත ලිපියක් නිකුත් කිරීමට ජාතික පොලිස් කොමිෂන් සභාව වෙත දැනුම් දෙමු. තවද ඉහත

කී චෝදනා මත පැවැත්විය යුතු විධිමත් විනය පරීක්ෂණය ඒ අනුව කඩිනමින් ආරම්භ කිරීමටද  පොලිස් කොමිෂන් සභාව වෙත දැනුම් දෙමු.

ඉහත කී කොන්දේසිවලට යටත්ව මෙම අභියාචනය සම්බන්ධයෙන් වන නඩු කටයුතු මෙතෙකින් අවසන් කරමු.

විනිසුරු කේ.ටී.චිත්‍රසිරි
(සභාපති)

මම එකඟ වෙමි.

ජේ.ජේ.රත්නසිරි
(සාමාජික)

මම එකඟ වෙමි.

එස්.නන්දසේකරන්
(සාමාජික)

දෙව්මිනි/-